සැ. යු. — 2013.12.13 වැනි දින පළ වූ අංක 1,841 දරන ගැසට් පත්‍රයේ I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,842 - 2013 දෙසැම්බර් මස 20 වැනි සිකුරාදා - 2013.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 3730 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීන් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජනවාරි මස 10 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 දෙසැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

පී. එච්. එල්. වී. ද සිල්වා,
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3729- B 80795— 3,400 (2013/12)
F 1 -

# අතුරු ව්‍යවස්ථා

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ වැලිගෙපොල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,<br>
පළාත් පාලන විෂයයභාර අමාත්‍ය,<br>
සබරගමුව පළාත.

### වාහනවල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව සභා මාර්ගවල ධාවනය වන වාහන වල බර සහ වේගය සීමා කිරීම හා ධාවනය විධිමත් කිරීම පිළිබඳ ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

2. වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මාර්ග යනුවෙන් ප්‍රකාශයට පත් කොට ඇති හා වෙනත් අධිකාරියකට අයත් නොවන්නා වූ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ගවල බර වාහන ගමනාගමන විධිමත් කිරීම, පාලනය කිරීම, ධාවන වේගය හා බර සීමාවන් පැනවීම හා මාර්ගවලට වන හානිය අවම කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණ වේ.

3. මෙම අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රය පල කල දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

4. (1) මින් මතු ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද පළමු උපලේඛනයේ දැක්වෙන ගාස්තු ගෙවා ලබා ගන්නා ලද බලපත්‍රයක් දරන්නේ නම් මිස ඉහත දෙවන අතුරු ව්‍යවස්ථාවෙන් අර්ථ දැක්වෙන මාර්ගයක බර ටොන් 2 වඩා වැඩි වන්නා වූ ටිපර් රථයක්, ලොරි රථයක්, ට්‍රැක්ටරයක් මාර්ග ඉදිකිරීමේ යන්ත්‍රයක් ධාවනය කිරීම හෝ ගල් වැලි ආදී සියලු ගොඩනැගිලි ද්‍රව්‍ය හෝ වෙනත් ඛනිජ ද්‍රව්‍ය හෝ රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතු යි. තව ද මෙම මාර්ගයක් මතින් සතුන් ලවා හෝ ට්‍රැක්ටරයක් මගින් දැව කඳන් හෝ වෙනත් ද්‍රව්‍ය ඇද්දවීම හෝ ඇදගෙන යාම නොකල යුතු ය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු උපලේඛනයේ සඳහන් වන ගාස්තු අවශ්‍යතාවය මත කලින් කල සංශෝධනය කිරීමේ බලය වැලිගෙපොල ප්‍රාදේශීය සභාව සතු වන්නේ ය.

(3) වායු පීඩන ටයර් රහිත කිසිදු වාහනයක් වෙනත් වාහනයක පටවා මිස ප්‍රාදේශීය සභාවේ කිසිදු මාර්ගයක ධාවනය කිරීම නොකල යුතු ය.

5. ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක වාහන ධාවනය කළ හැකි උපරිම වේග සීමාව පැයට කි. මී. 25 නොඉක්මවිය යුතු ය.

6. ප්‍රාදේශීය සභාව විසින් වෙනත් අනු නීතියකින් විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක මෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන ස්ථානවල එම උපලේඛනයේ ම දැක්වෙන දිනයන් හා වේලාවන් තුළ වාහන නවතා තැබීම නොකල යුතු ය.

7. (1) කිසියම් පුද්ගලයෙකු මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන අතුරු ව්‍යවස්ථාවෙන් අර්ථ නිරූපනය වන මාර්ගයකින් කිසියම් ගොඩනැගිලි ද්‍රව්‍යයක් කෘෂිකාර්මික නිෂ්පාදනයක් දැව හෝ යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කරන්නේ නම් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සභාවේ සභාපතිවරයා වෙත යටත් පිරිසෙයින් දින 03කටවත් පෙර ඉදිරිපත් කළ යුතු ය.

(2) ඉහත 7.1 අනු ව්‍යවස්ථාව අනුව ඉල්ලීමක් ලැබුන කල්හි සභාපතිවරයා විසින් කාර්මික නිලධාරි හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකුගෙන් වාර්තාවක් කැඳවා නියමිත ගාස්තු හා හානි විය හැකි ප්‍රමාණයට ප්‍රමාණවත් ඇප තැන්පත් මුදලක් ලබාගත යුතු ය.

(3) ඉහත 7.2 අනු ව්‍යවස්ථාව යටතේ ඇප මුදල් හා නියමිත ගාස්තු අය කිරීමෙන් පසු ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව මිස අදාළ අවසරය ලබා නොදිය යුතු ය.

(4) ඉහත 7.3 අනු ව්‍යවස්ථාව යටතේ ලබා ගනු ලබන ඇප තැන්පතු මුදල නිදහස් කර දෙන ලෙසට ඉල්ලීමක් ලද විට ප්‍රථමයෙන් 10%ක දෙපාර්තමේන්තු ගාස්තු ද අනතුරුව හානියක් වී ඇතොත් එකී අලාභය ද තක්සේරු කර අය කර ගත යුතු ය.

(5) හානිය ඇප තැන්පතු මුදල ඉක්මවා යයි නම් එම අතිරේක මුදල ද ගෙවන ලෙස අදාළ පුද්ගලයාට නියම කිරීම නීත්‍යානුකූල වේ. එසේම හිඟ මුදල ගෙවන ලෙස නියම කර ඇති අවස්ථාවක දී ගෙවීම් පැහැර හරින්නේ නම් නිසි අධිකරණ බලය සහිත අධිකරණයක නඩු පවරා හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත්තේ ය.

(6) ඉහත 7.5 අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන් අනුගමනය කිරීම සාධාරණ නොවන්නේ යැයි සභාපතිවරයාට හැඟී යන අවස්ථාවල දී ඒ සඳහා යම් සහනයක් ප්‍රදානය කිරීමට මහ සභාවේ අනුමැතියට යටත් ව සිදු කිරීමට සභාවේ සභාපතිවරයාට බලය ඇත්තේ ය.

(8) ප්‍රාදේශීය සභාව සමග සංවර්ධන කටයුතුවලට අදාළ ගිවිසුම් වලට එළඹී ඇති කොන්ත්‍රාත්කරුවන් විසින් සභාපතිවරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීම් මගින් මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ගාස්තුවලින් නිදහස් කල හැකි ය.

(9) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම පරීක්ෂා කිරීමේ බලය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන වෙනත් නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(10) මෙම අතුරු ව්‍යවස්ථාව පිළිබඳ සෑම කඩ කිරීමක් ම වරදක් වන අතර කිසියම් තැනැත්තෙක් නිසි අධිකරණ බලය සහිත අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියෙන් නියම කර

ඇති දඩයකට ද, එම කඩ කිරීම දිගින් දිගටම කරගෙන යනු ලබයි නම්, එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව ද ඒ වරද කරගෙන යන්නේ නම් ඒ සෑම දිනයක් සඳහා ම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියේ සඳහන් අතිරේක දඩයකට යටත් විය යුතු ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් ව්‍යවස්ථාවක අර්ථය සම්බන්ධයෙන් ව්‍යාකූලත්වයක් ඇති වුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවකම බලාත්මක විය යුතු ය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා ප්‍රාදේශීය සභාව යන්නෙන් වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ද සභාපතිවරයා යන්නෙන් වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද ලේකම් යන්නෙන් වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද වෙනත් බලය පවරන ලද නිලධාරියෙකු යන්නෙන් වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ වෙනත් නිලධාරියෙකු ද ග්‍රාම නිලධාරියෙකු ද පොලිස් නිලධාරියෙකු ද අදහස් වේ.

### උපලේඛනය 01

1. *වැලි, පස්, සහ වෙනත් ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය.-*

(i) කියුබ් 1 සිට 2 දක්වා බර වාහනයක් එක් වරක් ප්‍රවාහනය කිරීම සඳහා ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1,000 කි. එක් වාරයක් සඳහා බලපත්‍ර ගාස්තුව රු. 100 කි.

(ii) කියුබ් 2 සිට 4 දක්වා බර වාහනයක් එක් වරක් ප්‍රවාහනය කිරීම සඳහා ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1,000 කි. එක් වාරයක් සඳහා බලපත්‍ර ගාස්තුව රු. 200 කි.

(iii) කියුබ් 4ට වැඩි බර වාහනයක් එක් වරක් ප්‍රවාහනය කිරීම සඳහා ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1000 කි. වැඩිවන සෑම කියුබ් 1ක් සඳහාම බලපත්‍ර ගාස්තුව රු. 10 බැගින් වැඩි වේ.

2. *දර, උණ දඬු හා දැව කඳන් ප්‍රවාහනය.-*

(i) ට්‍රැක්ටරයක් සඳහා එක් ගමන් වරකට ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1000 කි. එක් වාරයක් සඳහා බලපත්‍ර ගාස්තුව රු. 200 කි.

(ii) ලොරි, ටිප්පර් හෝ ට්‍රක් රථයක් සඳහා ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1000 කි. එක් වාරයක් සඳහා බලපත්‍ර ගාස්තුව රු. 300 කි.

(iii) ඉදිකිරීම් වෙනත් යන්ත්‍ර (චේන් ලෝඩරයක් නොවන) සඳහා ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1000 කි. එක් දිනක් සඳහා බලපත්‍ර ගාස්තුව රු. 1000 කි.

3. *කෘෂිකාර්මික ද්‍රව්‍ය ප්‍රවාහනය.-*

(i) ටොන් 1ක් හෝ ඉන් කොටසක් හෝ ලොරි/ටිප්පර් රථයකින් දිනපතා හෝ මසකට දින 5 කට වැඩි ප්‍රවාහනය සඳහා (ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1000 කි) එක් වරකට බලපත්‍ර ගාස්තුව රු. 50 ක් හෝ මසකට දින 10කට වැඩි ප්‍රවාහන කටයුතු සඳහා රු. 500 කි.

(ii) ටොන් 2 කට වැඩි බර ඇති ලොරි/ටිප්පර් රථයකින් දිනපතා හෝ මසකට දින 5කට ප්‍රවාහනය කටයුතු සඳහා (ආපසු නොගෙවන තැන්පත් මුදල රු. 1000 කි.) එක් වරකට බලපත්‍ර ගාස්තුව රු. 75 ක් හෝ මසකට දින 10කට වැඩි වන ප්‍රවාහන කටයුතු සඳහා රු. 750 කි.

### උපලේඛනය 02

*වාහන නවතා නොතැබිය යුතු ස්ථාන හා වේලාවන්.-*

1. ඕපනායක ර/විද්‍යාකර ඉසුරු පාසල අසළ සතියේ දින 05 තුළ පෙ. ව. 6.00 සිට ප. ව. 2.00 දක්වා,

2. වැලිගෙපොල ර/වලගම්බා මධ්‍ය මහා විද්‍යාලය අසළ සතියේ දින 05ක් තුළ පෙ. ව. 6.00 සිට ප. ව. 2.00 දක්වා,

3. වැලිගෙපොල සතිපොල පැවැත්වෙන දිනයන්හි පොළ සීමාව තුළ පෙ. ව. 6.00 සිට ප. ව. 2.00 දක්වා,

4. ඕපනායක සතිපොල පැවැත්වෙන දිනයන්හි පොල සීමාව තුළ පෙ. ව. 6.00 සිට ප. ව. 2.00 දක්වා.

12-803

---

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර වැලිගොපොල ප්‍රාදේශීය සභාව විසින් 2012.10.31 දින සම්මත කර ඇති ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම, පාලනය කිරීම සහ වාහනවලින් ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය සමග කියවිය යුතු, ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තිය (1) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍ය මහීපාල හේරත් වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මක වන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

සබරගමුව පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

### වැලිගෙපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම පාලනය කිරීම සහ වාහනවලින් ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථානවල නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

2. මෙහි මින්මතු සභාපතිවරයා වශයෙන් හඳුන්වනු ලබන වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නවතා තැබීම හෝ නතර කර තැබීම තහනම් කරන හෝ සීමා කරන නැතහොත් පාලනය කරන යම් වීදියක, වීදියක කොටසක වාහන සඳහා වෙන් කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානය යනුවෙන් අදහස් කරන දැන්වීමක් ඒ වීදියෙහි නැතහොත් වීදියෙහි කොටසක ප්‍රකට ස්ථානයක සිට පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය. එසේ ප්‍රදර්ශනය වන ස්ථානයන්හි මිස වෙනත් තැනක වාහන නවතා තැබීම නොකළ යුතු ය.

3. පොදු වාහන නවතා තැබීමේ ස්ථානයකට හැර මෝටර් කාර් එකක්, මෝටර් රිය පෙට්ටියක්, ලොරියක්, බස් රථයක්, යතුරු පැදියක්, ත්‍රී රෝද රථයක් හෝ වෙනත් මෝටර් වාහනයක් කිසියම් තැනැත්තෙකු විසින් වෙනයම් ස්ථානයක නවතා තැබීම නොකළ යුතු ය.

4. පොදු මෝටර් වාහන නතර කරන ස්ථානයක් තුළ කිසියම් තැනැත්තෙකු මෝටර් කාර් එකක්, මෝටර් රිය පෙට්ටියක්, ලොරියක්, බස් රථයක්, යතුරු පැදියක්, ත්‍රී රෝද රථයක් හෝ වෙනයම් මෝටර් වාහනයක් එම වාහනයේ අයිතිකරු හෝ රියදුරු අත තමා සන්තකයේ සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් ඇත්නම් මිස පොදු ස්ථානයක මෝටර් වාහනයක් නවතා තැබීම නොකළ යුතු ය.

5. වැලිගෙපොල ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරනු ලබන ඉල්ලීම අනුව එකී අවසර පත්‍ර නිකුත් කරනු ලබන අතර, සෑම අවසර පත්‍රයක්ම දෛනිකව පැය ගණනට හෝ මාසික වශයෙන් නිකුත් කරනු ලැබේ. එකී සෑම අවසර පත්‍රයක්ම අවශ්‍යතාවයට අනුව මෙහි අංක 2 හා 3 උපලේඛනවල සඳහන් දෛනික හෝ මාසික ගාස්තු ගෙවා ලබා ගත යුතු ය.

6. අතුරු ව්‍යවස්ථාව 4 යටතේ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක් ම ඒ අවසර පත්‍ර නිකුත් කරන ලද්දේ යම් මෝටර් කාර් එකක්, මෝටර් රිය පෙට්ටියක්, ලොරියක්, බස් රථයක්, යතුරු පැදියක්, ත්‍රී රෝද රථයක් හෝ වෙනයම් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ද ඒ මෝටර් වාහනය හඳුනා ගැනීමේ අංකය පැහැදිලිව සඳහන් විය යුතු අතර අවසර පත්‍රය සඳහන් කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතු ය.

7. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙක් විසින්ම එම අවසර පත්‍රය වාහනයේ පිටතට පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

8. අතුරු ව්‍යවස්ථා 4 යටතේ පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක නවතා තැබූ මෝටර් කාර් එකක්, මෝටර් රිය පෙට්ටියක්, ලොරියක්, බස් රථයක්, යතුරු පැදියක්, ත්‍රී රෝද රථයක් හෝ වෙනයම් මෝටර් වාහනයක් අයිතිකරු හෝ රියදුරු විසින් ඒ වාහනය සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය ඉදිරිපත් කරන ලෙස පොලිස් නිලධාරියකු හෝ රථ වාහන පාලකයකු හෝ එම කාර්යය සඳහා සභාව විසින් බලය දෙනු ලැබූ තැනැත්තෙකු විසින් ඉල්ලනු ලැබූ කවර හෝ අවස්ථාවක ඒ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

9. යම් පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක් නියමිත පන්තියේ හෝ වාහනයක මෝටර් වාහන සඳහා පමණක් වෙන් කරනු ලැබූ අවස්ථාවක යම් තැනැත්තෙකු විසින් එම වාහන නවතා තැබීමේ ස්ථානයට ඒ පංතියට හෝ වර්ගයට අයත් නොවන වෙනත් මෝටර් වාහනයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

10. යම් තැනැත්තෙකු මෝටර් කාර් එකක්, මෝටර් රිය පෙට්ටියක්, ලොරියක්, බස් රථයක්, යතුරු පැදියක්, ත්‍රී රෝද රථයක් හෝ වෙනයම් මෝටර් වාහනයක් පොදු වාහන නවතා තැබීමේ ස්ථානයට ඇතුල් වන්නා වූ හෝ පිට වන්නා වූ හෝ මෝටර් කාර් එකකට, මෝටර් රිය පෙට්ටියකට, ලොරියකට, බස් රථයකට, යතුරු පැදියකට, ත්‍රී රෝද රථයකට හෝ වෙනයම් මෝටර් වාහනයක බාධා වන ආකාරයකින් මෝටර් වාහනය නවතා තැබීම නොකළ යුතු ය.

11. යම් තැනැත්තෙකු පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක මෝටර් කාර් එකක්, මෝටර් රිය පෙට්ටියක්, ලොරියක්, බස් රථයක්, යතුරු පැදියක්, ත්‍රී රෝද රථයක් හෝ වෙනයම් මෝටර් වාහනයක් නවත්වනු ලැබ ඇති අතරතුර එම මෝටර් වාහනයක් සේදීම හෝ සෝදනු ලැබීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.

12. *කිසිම තැනැත්තෙකු විසින් .-*

(අ) පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක මෝටර් කාර් එකක්, මෝටර් රිය පෙට්ටියක්, ලොරියක්, බස් රථයක්, යතුරු පැදියක්, ත්‍රී රෝද රථයක් හෝ වෙනයම් මෝටර් වාහනයක් අළුත්වැඩියා කිරීම පොදු වාහන නවතා තැබීමේ ස්ථානයෙන් ඒ වාහනය ඉවත් කිරීමේ කටයුත්ත සඳහා එසේ අළුත්වැඩියා කිරීම අවශ්‍ය වන්නේ නම් මිස නොකළ යුතු ය.

(ආ) 10 (අ) ඡේදයේ සඳහන් අවසරය මත එවැනි අළුත්වැඩියාවන් කිරීමේ දී අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමට අනවශ්‍ය වන අයුරින් හෝ අසාධාරණය වන යම් ශබ්දයක් නොකළ යුතු ය.

13. යම් තැනැත්තෙකු විසින් පොදු වාහන නවතා තැබීමේ ස්ථානයක් ඇතුළත යම් අනිසි ආකාරයකින් හැසිරීම හෝ යම් හිරිහැරයක් සිදු කිරීම හෝ නොකළ යුතු ය.

14. සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩලයක් විසින් ඔවුන්ගේ මෝටර් කාර්, මෝටර් රිය පෙට්ටි, ලොරි, බස් රථ, යතුරු පැදි, ත්‍රී රෝද රථ හෝ වෙනයම් මෝටර් වාහනයක් සඳහා නියමිත ගාස්තු සභාවට ගෙවා එම සංස්ථාවේ හෝ සංස්ථාගත කරනු නොලැබූ ඒ පුද්ගල මණ්ඩලයට අයිති මෝටර් වාහන සඳහා නියමිත ගාස්තු සභාවට ගෙවා එම සංස්ථාවේ හෝ සංස්ථාගත කරනු නොලැබූ ඒ පුද්ගල මණ්ඩලයට අයිති මෝටර් වාහන සඳහා මාසික අවසර පත්‍රයක් ලබා ගත හැකි ය. (රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වාහන මෙකී නියමයෙන් නිදහස් වේ.)

15. (අ) මෙම අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) එක් එක් දවසේ පෙ. ව. 6.00 සිට ප. ව. 6. 00 දක්වා මේ අතුරු ව්‍යවස්ථා බල පැවැත්විය යුතු ය.

16. සභාවේ ලිඛිත නියමයකින් නිශ්චිත නියමයකින් නිශ්චිත තැනැත්තන් හෝ පන්තියක් ඔවුන්ගේ මෝටර් කාර්, මෝටර් රිය පෙට්ටි, ලොරි, බස් රථ, යතුරු පැදි, ත්‍රී රෝද රථ හෝ වෙනයම් මෝටර් වාහනයක් සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ ගාස්තු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

17. මෙම අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් වූ සෑම කඩ කිරීමකින් වරදක් වන අතර නිසි අධිකරණ බලය ඇති අධිකරණයක දී වරදකරු වුවහොත් එම තැනැත්තාට එම වැරදි ක්‍රියාව සඳහා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියේ සඳහන් දඩයක් නියම කළ හැකිය. එම වරද තවදුරටත් කරගෙන යන විටෙක නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව එම කඩකිරීම ගැන අවධානය යොමු කරමින් සභාවේ සභාපතිවරයා විසින් ලිඛිත දැන්වීමකින් පසු එම වරද තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහා ම ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තියේ සඳහන් අතිරේක දඩයක් පැනවිය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල "සභාව" යන්නෙන් වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ද "සභාපති" යන්නෙන් වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ සභාපති/විශේෂ කොමසාරිස්/බලයලත් නිලධාරි ද හඳුන්වනු ලැබේ.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ සහ ඉංග්‍රීසි පිටපත්වල නොගැලපෙන යම් අවස්ථාවක දී සිංහල පිටපත බල පැවැත් වේ.

20. ත්‍රී රෝද රථ සංගම් පාලනය කරවීමට ප්‍රාදේශීය සභාව මගින් කමිටුවක් පත් කිරීම කළ හැකි වන්නේ ය.

එම කමිටුවේ සභාපති නිල වශයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපති විය යුතු අතර ලේකම් නිල බලයෙන් සභාවේ ලේකම් වන්නේ ය. සභාවේ මන්ත්‍රීවරුන් 03 දෙනෙක් වාහන භාර නිලධාරි බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති හෝ ඔහුගේ නියෝජිතයෙක් සහ ප්‍රාදේශීය සභාවේ මෙම විෂය භාර නිලධාරි ද මෙම කමිටුවේ සෙසු සාමාජිකයන් විය යුතු වන්නේ ය.

"ලොරිය" යන්නෙන් අදහස් කරන්නේ මෝටර් වාහනයක් හෝ විශේෂයෙන් බඩු පටවාගෙන යාම සඳහා නිමවා ඇති රියක් හෝ ට්‍රේලරයක් සහිතව තනන ලද හෝ ප්‍රයෝජනයට ගත හැකි වාහනයක් එහෙත් ගොවිපලක් තුළ පාවිච්චි කරන වාහන මෙම වර්ගයට අයත් නොවේ.

"මෝටර් කාර්" යන්නෙන් අදහස් කරන්නේ මෝටර් වාහනයකි. එහෙත් යතුරු පැදියක්, ගිලන් රථයක්, මිනී අදින රථයක් හෝ දුබල පුද්ගලයන් ප්‍රවාහනය කෙරෙන රියදුරු සමඟ පුද්ගලයින් 8 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් සහ ඔවුන්ගේ පුද්ගලික බඩුබාහිරාදිය ගෙන යාම සඳහා ට්‍රේලරයක් සහිත වාහනයක් නොවේ.

"මෝටර් රිය පෙට්ටිය" යනු මෝටර් වාහනයකි. ගිලන් රථයක් මිනී කාර් එකක් නොවේ. මෙය රියදුරු සමඟ මගීන් 8 දෙනෙකුගේ හා ඔවුන්ගේ පුද්ගලික බඩුබාහිරාදියත් ප්‍රවාහනය කිරීම සඳහා ට්‍රේලරයක් සහිතවම නිපදවා ඇත.

"මෝටර් වාහනය" යන්න -

*(අ)* යන්ත්‍රානුසාරයෙන් ඉදිරියට හා පසු පසට ක්‍රියා කෙරෙන ඕනෑම වාහනයක් ට්‍රේලරයක් සමඟ ට්‍රැක්ටරයක් හෝ මහා මාර්ගයේ පාවිච්චිය සඳහා උපයෝගී වන සහ මෝටර් වාහන රෙජිස්ට්‍රාර් විසින් අවසර දී ඇති වාහනයකි. පාර තලන රෝල මෙම වර්ගයට අයත් නොවේ.

*හෝ*

*(ආ)* යන්ත්‍රානුසාරයෙන් ඉදිරියට හෝ පසුපසට ක්‍රියාකෙරෙන කෘෂි කර්මාන්තය සඳහා ගොවිපල පාවිච්චියට හෝ ගොඩනැගිලි තැනීම සඳහා පොළොව මට්ටම් කිරීම, ඇල හා ගංගා පතුලේ මඩ හා වැලි ඉවත් කිරීම, පස් ඇදීම හා පැටවීම හෝ එවැනි සමාන ක්‍රියාවල යොදවන වාහන, මෝටර් රථ රෙජිස්ට්‍රාර් විසින් අනුමත කරන ලද වාහන, පාර තලන රෝලර් මෙම වර්ගයට අයත් නොවේ.

"බස් රථය" යන්න මෝටර් රථ පෙට්ටියකි. මෙය බස් රථයක් ලෙස ලියාපදිංචි කර ඇත. මගීන් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා මෝටර් රථයකි.

"නතර කිරීම" යනු මෝටර් වාහනයක් කිසියම් කරුණක් සඳහා නවතා තැබීම එහෙත් මගීන් හෝ බඩුබාහිරාදිය පැටවීමට නොවේ.

"පොලිස් නිලධාරී" යනු නිල ඇඳුමෙන් සැරසී සිටින පොලිස් සේවයේ නියුතු සාමාජිකයෙකි.

"වාහන පාලක" යනු ප්‍රාදේශීය සභාව විසින් මෝටර් වාහන නවතා තැබීමට සකස් කර ඇති පොදු වාහන නතර කිරීමේ ස්ථානවල නවත්වන වාහනවලට අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා සභාපති විසින් පත් කර ඇති බලය දෙන ලද තැනැත්තා හෝ තැනැත්තී ය.

### උපලේඛන අංක 01

ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

*වාහන නතර කර තැබීමේ ස්ථාන*

*ත්‍රී රෝද රථ ගාල්.-*

බදුල්ල - කොළඹ මහා මාර්ගය :

01. කැන්දකැටිය හංදිය බස් නැවතුම් පොළ අසල (වම් පැත්ත)
02. මාදොළ පන්සල හංදිය (වම් පැත්ත)
03. හෙලපල්ල වංගුව හංදිය (වම් පැත්ත)
04. හොරන්කඳුර හංදිය බස් නැවතුම්පොල අසල (වම් පැත්ත)
05. උඩවෙල අකරැල්ල පාර (වම් පැත්ත)
06. කරගහයට හංදිය (වම් පැත්ත)
07. කන්දේ විහාර හන්දිය හා ගල්හිර හංදිය (දකුණු පැත්ත)
08. බෝගහ හංදිය වල්ලකැටිය පාර අසල (වම් පැත්ත)
09. ඕපනායක විජයාරාම පංසල හංදිය (වම් පැත්ත)
10. ඕපනායක පොළ ඉදිරිපිට (දකුණු පැත්ත)
11. ඕපනායක හෝරාස්ථම්භය අසල (වම් පැත්ත)
12. දෙල්ගස් හංදිය බෝගහයට (වම් පැත්ත)
13. දෙල්ගස් හංදිය හත්තැල්ල පාරට හැරෙන කොටස (වම් පැත්ත)
14. දාන්දාව පාලම අසල (වම් පැත්ත)
15. හුණුවල හංදිය රබර් කම්හල ඉදිරිපිට (වම් පැත්ත)
16. පොල්බොක්ක හංදිය හුණුවල පාලම අසල (වම් පැත්ත)
17. හල්ලින්න හංදිය දකුණු පැත්ත (වම් පැත්ත)
18. අමුවත්ත හංදිය (වම් පැත්ත)
19. හුණුවල රබර් කම්හල අසල

හුණුවල - මිල්ලකඩේ පාර :

20. හැටිහක්වල විද්‍යාලය අසල
21. හුණුවල ප්‍රාදේශීය රෝහළ අසල

දෙල්ගස් හන්දිය - බටදූර පාර :

22. හත්තැල්ල පාර හත්තැල්ල හංදිය
23. බටදූර හංදිය

උඩවෙල - රංවල පාර :

24. අකරල්ල පාර පරගහමඩිත්ත හංදිය
25. අකරල්ල පාර උඩවෙල හංදිය හා උඩගම හංදිය

**ලොරි/වෑන් රථ/පාසල් බස් රථ**

1. දෙල්ගස් හංදිය පැලතවාන ඉදිරිපිට රථ ගාල
2. දෙල්ගස්ළඟ බෝධිය අසල රථ ගාල
3. ඕපනායක පාසල/පේෂකර්ම මධ්‍යස්ථානය අසල රථ ගාල
4. හල්ලින්න හංදිය බස් නැවතුම ඉදිරිපිට රථ ගාල
5. ඕපනායක මහජන බැංකුව ඉදිරිපිට රථ ගාල
6. ඕපනායක මිදැල්ලදෙනිය පාර හංදිය සිට වම්පස රථ ගාල

**වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

*වාහන නතර කර තැබීමේ ස්ථාන*

*ත්‍රිරෝද රථගාල් :*

බලන්ගොඩ - පල්ලෙබැද්ද මාර්ගය :

01. සඳගනාගම හංදිය
02. කෝන්ගස්තැන්න හංදිය
03. පනාන බස් නැවතුම්පොල අසල
04. පොල්ලමුර හංදිය
05. වැලිගෙපොල රෝහල ඉදිරිපිට
06. වැලිගෙපොල උදේනි වීරසේකර මාවත අසල
07. වැලිගෙපොල සරත් ස්ටෝර්ස් ඉදිරිපිට
08. වැලිගෙපොල ලංකා බැංකුව ඉදිරිපිට
09. මැදගංඔය හන්දිය
10. කුලරත්න ගම්මාන හංදිය
11. හංවාන හංදිය
12. කජුවත්ත අසල හංදිය (අක්කර ගොඩ)
13. අක්කර 25 හංදිය (අම්බැවිල)
14. අම්බැවිල හන්දිය
15. මගයාය හන්දිය (සමුපකාරය ඉදිරිපිට)
16. කලටුවාව කන්ද පාලම අසල
17. බුළුවල බෝධිය අසල
18. මහඕමාර හංදිය
19. රංවල රෝහල අසල
20. තැන්නහේන අසල
21. රංවල පන්සල අසල
22. සඳගනාගම හංදිය
23. දෙල්වල කන්ද හංදිය (උඩරංවල)

පොල්ලමුර - කපුගල මාර්ගය :

24. හඳගිරිය බස්නැවතුම අසල වැලිගෙපොල යටිපස්ගමුව මාර්ගය

වැලිගෙපොල - යටිපස්ගමුව මාර්ගය :

25. යටිපස්ගමුව හංදිය

වැලිගෙපොල - මුත්තෙට්ටුපල පාර :

26. හැවන්දෙනිය හංදිය
27. හටන්ගල පන්සල හංදිය

ගල්පාය පාර :

28. මුත්තෙට්ටුපල පාසල් හන්දිය
29. කොක්වලයාය හන්දිය
30. ගල්පාර පොළ ඉදිරිපිට
31. ගල්පාය පාසල අසල
32. ගල්පාය බඹරගල හන්දිය
33. කොලොන්ගස් යාය හන්දිය
34. තෙළඹුගහ අතුර මඩුව කඩේ හන්දිය

අම්බැවිල පාර :

35. වෙළගෙපොල හන්දිය

**ලොරි/වෑන් රථ/පාසල් බස් රථ**

වැලිගෙපොල නගරය :

1. ට්‍රාන්ස්පෝමරය අසල රථ ගාල
2. කොට්ටිමුල්වල මාර්ගයේ වැලිගෙපොල නගරයේ සිට කොට්ටිමුල්වල දෙසට (වම් පැත්ත)

පරගහමඩිත්ත - කෝන්ගස්තැන්න පාර :

1. ඉළුක්කුඹුර මැද්දෙකන්ද මාර්ගය අසල
2. පනාන බස් නැවතුම්පොල අසල

**උපලේඛන අංක 2**

| | | *පළමුවන පැය හෝ ඉන් කොටසක් සඳහා ගාස්තු* | *පළමුවන පැයට වැඩි පැය 4ක් නොඉක්මවන්නා වූ සෑම අතිරේක පැය භාගයක් හෝ ඉන් කොටසක් සඳහා ගාස්තු* | *පැය 4 ඉක්මවන්නා වූ සෑම පැය භාගයකටම හෝ ඉන් කොටසක් සඳහා ගාස්තු* |
|---|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| *(අ)* | මෝටර් සයිකලයක් සඳහා | නැත | නැත | නැත |
| *(ආ)* | මෝටර් රථයක් හෝ මෝටර් කෝච් රථයක් හෝ ත්‍රී රෝද රථයක් සඳහා | 2 0 | 1 0 | 1 0 |
| *(ඇ)* | ට්‍රේලරයක් සහිත ට්‍රැක්ටරයක් හෝ ලොරියක් සඳහා | 3 0 | 1 50 | 1 50 |
| *(ඈ)* | ට්‍රේලරයක් රහිත ට්‍රැක්ටරයක් හෝ වෙනයම් වාහනයක් සඳහා | 2 0 | 1 0 | 1 0 |
| *(ඉ)* | බස් රථයක් සඳහා | 3 0 | 2 0 | 2 0 |

**උපලේඛන අංක 03**

| | | රු. ශත |
|---|---|---|
| 1. | ත්‍රී රෝද රථයක් සඳහා මසකට | 100 0 |
| 2. | කාර් රථයක් හෝ වෑන් රථයක් සඳහා මසකට | 150 0 |
| 3. | (1) ලොකු ලොරියක් සඳහා මසකට | 200 0 |
| | (2) කුඩා ලොරියක් සඳහා මසකට | 150 0 |
| | (3) ට්‍රැක්ටරයක් සඳහා (ට්‍රේලරයක් සහිත හෝ රහිත මසකට) | 75 0 |
| 4. | බස් රථයක් සඳහා මසකට | 300 0 |

12-804

---

### වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ වැලිගෙපොල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව (ජල කර්මාන්ත අංශය)**

*(අ)* ආකෘතිය (9 වැනි අතුරු ව්‍යවස්ථාව)

1. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :............................................................................................................ (පූජ්‍ය/මයා/මිය/මෙනෙවිය)
(සිංහලෙන් පැහැදිලිව)

(ii) මුල්'කුරු සමග නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
Rev./Mr./Mrs./Miss (අදාළ වචන ඉතිරි කර අනවශ්‍ය වචන කපා හරින්න.)

(iii) ජාතික හැඳුනුම්පත් අංකය :

2. ජල සම්බන්ධය අවශ්‍ය ස්ථානයේ ලිපිනය :
(සිංහලෙන් පැහැදිලිව)

(i) නිවාස අංකය :
අතුරු පාර :
ග්‍රාමය/ප්‍රධාන පාර :
නගරය :
දිස්ත්‍රික්කය :
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :
(ii) ග්‍රා.නි. කොට්ඨාසය :

3. (i) ලිපි යැවිය යුතු ලිපිනය :

(ii) දුරකථන අංකය නිවස :

4. අයදුම්කරු එම ස්ථානයේ අයිතිකරු/බදුකරු/කුලී කරු ද යන වග : [ ]

5. වරිපනම් සහතිකය/ග්‍රාම නිලධාරි පදිංචි සහතිකය/ඉඩමේ ඔප්පුව ඉදිරිපත් කරමි. (අනවශ්‍ය වචන කපා හරින්න.)

6. (i) පාරිභෝගික කටයුතු සඳහා නම් කරන ලද බැංකුව : [ ]
   (ii) ගිණුම් අංකය : [ ]

7. (i) මෙම ස්ථානයට මීට පෙර ජල සම්බන්ධයක් ලබා ගෙන තිබේ ද ? [ ]
   (ii) තිබේ නම් වර්ගය : [ ]
   (ගෘහ/රාජ්‍ය/ව්‍යාපාරික/ආගමික)

8. ඔබ ජල සැපයුම ඉල්ලුම් කරන ස්ථානය යම් ප්‍රජාමූල සංවිධානයකින් කරන ජල යෝජනා ක්‍රමයකින් ආවරණය වන්නේ ද ? (ඔව්/නැත) [ ]

9. ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානය පහසුවෙන් සොයා ගැනීම සඳහා අවශ්‍ය සම්පූර්ණ විස්තර සහිත ස්ථානයට ලඟාවිය හැකි මාර්ගය කටු සටහනකින් දක්වන්න.

[ ]

10. යාබද නිවසේ ජල සම්බන්ධතාවක් තිබේ නම් පදිංචිකරුගේ නම :........................................................................................................................................................

මෙම අයදුම්පතෙහි දක්වා ඇති ස්ථානයට ජල සම්බන්ධනයක් ලබා ගැනීම සඳහා ඊට අදාළව කොන්දේසි හා උපදෙස් කියවා හොඳින් තේරුම්ගත් බවත්, අයදුම්පතෙහි සඳහන් කළ සියළුම තොරතුරු සත්‍යය බවත්, අසත්‍ය තොරතුරු සැපයීම හේතුවෙන් ජල සම්බන්ධතාවය විසන්ධි කරන්නට සිදුවුවහොත් ඒ සඳහා වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට බලය ඇති බවත්, හොඳින් දැන අත්සන් තබමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

**කාර්යලයීය ප්‍රයෝජනය සඳහා**

1. අයදුම්පත නිකුත් කළ දිනය : [ | | | | | | | ]
2. ලියාපදිංචි අංකය : [ | | | | | | | ]

---

1. කාර්මික නිලධාරි වාර්තාව :..........................................................................................................
   ..........................................................................................................
   ..........................................................................................................
   ..........................................................................................................

2. ලබා දුන් ජල සම්බන්ධනය පිළිබඳ විස්තරය :
   (i) ප්‍රභේද ගෘහ/රාජ්‍ය/වාණිජ/පූජනීය

3. මනුවේ වර්ගය : [ ]
4. මනුවේ ප්‍රමාණය : [ ]
5. ජල සැපයුම දුන් දිනට කියවීම : [ ]
6. මනු අංකය : [ ]
7. ජල සැපයුම ලබා දුන් දිනය : [ ]

.........................................................
සභාපති නිර්දේශය,
අනුමත කරමි./නොකරමි.

අනුමත නොකරන්නේ නම් හේතු :..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................

දිනය :.....................................

| | |
|---|---|
| ලිපිකරු සටහන් : | |
| තැම්පත් කළ මුදල : | |
| ලදුපත් අංකය හා දිනය : | |
| ජලකර්මාන්ත අංශයට යොමුව : | |
| වැඩ නිම කල බවට කාර්මික නිළධාරි වාර්තාව : | |

.......................................................
අත්සන කාර්මික නිලධාරී.

දිනය :.........................................

**වැලිගෙපොල ප්‍රාදේශීය සභාව**

*"ඇ" ආකෘතිය (42 වැනි අතුරු ව්‍යවස්ථාව)*

1. එක් පාර්ශවයක් ලෙස (මෙහි මින්මතු අයිතිකරු වශයෙන් සඳහන් කරනු ලබන ..........................................................................පිහිටි වරිපනම් අංක.................................දරන ස්ථානයේ අයිතිකරු/පදිංචිකරු වන..............................සහ අනික් පාර්ශවය ලෙස වැලිගෙපොල ප්‍රාදේශීය සභාව ද අතර ගෘහමය කාර්යයන් සඳහා/ගෘහමය නොවන කාර්යයන් සඳහා ජලය සැපයීම පිණිස එළඹෙන ලද ගිවිසුමයි.

2. ගෘහමය නොවන කාර්යයන් සඳහා ඉහත කී ස්ථානයට ජල සේවයක් ලබා දීම සඳහා ප්‍රතිඡ්ඨාව, එනම්,

(අ) ..............................................................................................................................................
(ආ) ..............................................................................................................................................
(ඇ) ..............................................................................................................................................

මෙහි මින්මතු දක්වා ඇති කොන්දේසිවලින් බැඳී සිටීමට අයිතිකරු/පදිංචිකරු මෙයින් ගිවිස ගනී.

(අ) අඟල්.....................................මාපකක් මගින් ජලය සැපයිය යුතු ය.
(ආ) අයිතිකරු විසින් මාපක ගාස්තුව, සේවා ගාස්තුව සහ ඇප මුදල් වශයෙන් රු.....................................ක (රු..........................) මුදලක් සේවා සැපයීමට කලින් ප්‍රාදේශී සභාවේ සභාපතිවරයාට ගෙවීම හෝ ගෙවීමට සැලැස්විය යුතු යි.
(ඇ) එක් එක් මාසයෙහි දී සපයන ලද ජල ප්‍රමාණය වෙනුවෙන් සභාව විසින් නියම කර ඇති ගාස්තු අනුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවීම හෝ ගෙවීමට සැලැස්විය යුතු ය.

3. මාපකය සඳහා හෝ ජලය සඳහා වූ ගාස්තු නියමිත දිනයෙන් දින 15ක් ඇතුළත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ගෙවනු නොලැබුවහොත් සේවාව පාවිච්චි කිරීමේ අයිතිය අහිමි වන අතර, ප්‍රාදේශීය සභාව විසින් නතර කළ හැකි ය.

4. දෙපාර්ශවයෙන් කවර පාර්ශවයක් වුව ද ගිවිසුම අවසන් කිරීමට තමා අදහස් කරන බව දන්වන දින 30ක දැන්වීමක් අනෙක් පාර්ශවයට දීමෙන් ගිවිසුම අවසන් කළ හැකි ය. එය එසේ අවසන් කරනු ලැබූ විට අළුත් ගිවිසුමකට එළඹෙන තුරු ස්ථානයේ අයිතිකරුට/පදිංචිකරුට සේවාව පාවිච්චියට ගැනීම සඳහා අයිතිවාසිකම් නොමැත්තේ ය.

පදිංචිකරු වෙනස්වීමට ආසන්න කවර අවස්ථාවක වුව ද අයිතිකරු විසින් නිසි ලෙස දැන්වීමක් කළ යුතු අතර, ඉහත සඳහන් කොන්දේසි පිළිපැදීමට ලියවිල්ලක් මගින් එකඟ වන තෙක් කිසිම පදිංචිකරුවෙකුට සේවාව පාවිච්චි කිරීමට හිමිකම් නොලැබේ.

201...... ක් වූ ................. මස ..........................වැනි දින දී අත්සන් කරන ලදී.

.........................................................
ප්‍රාදේශීය සභාවේ සභාපති.

..................................................
අයිතිකරු/පදිංචිකරු.

අත්සනට සාක්ෂි :...........................................................

12-805

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.